# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1690/11 - 2011 ජනවාරි 27 වැනි බ්‍රහස්පතින්දා - 2011.01.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

### මුදල් නීති පනත

(422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 32ඉ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන ලද රෙගුලාසි.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
සභාපති,
මුදල් මණ්ඩලය.

2011 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ය.

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි**

**2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ නියෝග සංශෝධනය**

1. හැඳින්වීම

1.1 මෙම රෙගුලාසි, "2011 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය පිළිබඳ රෙගුලාසි" යනුවෙන් හැඳින්විය යුතු ය.

2. මූලික රෙගුලාසි සංශෝධනය

2.1 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 1673/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ නියෝගයන් පහත පරිදි සංශෝධනය වේ.

රෙගුලාසිය යන වචනය"ආදේශනය"

2.2 "නියෝගය" යන වචනය වෙනුවට "රෙගුලාසි" යන වචනය අදාළ සෑම ස්ථානයකදී ම මෙයින් ආදේශ කරනු ලැබේ.

5.2(iii) දරන රෙගුලාසිය සඳහා ආදේශනය

2.3 5 වැනි රෙගුලාසිය, එහි 5.2(iii) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කෙරේ.

"5.2(iii) අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන කළමනාකාරවරුන්ට සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වන යහ පාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකු පනත් විධානයන්, බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන යහ පාලනය පිළිබඳ 2007 අංක 12 දරන බැංකු පනත් විධානයන් සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් සඳහා වන 2008 අංක 3 දරන මූල්‍ය සමාගම් පනත් (යහ පාලන) විධානයන් මගින් නිශ්චය කර ඇති කොටස් හිමියන් නොවන වෙනත් සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු තැන්පතු වගකීම්."

02-280